

# චමරි අතපත්තු මෙල්බර්න් රෙනේගේඩ්ස් කණ්ඩායමට

වර්නන් තිසේරා

අවුරුදු 4/5 කට කලින් ලංකාවට මෙහි සිට කාන්තා ක්‍රිකට් කණ්ඩායමක් පැමිණි අවස්ථාවක එවකට කණ්ඩායමේ ක්‍රීඩා පුහුණුකරු හර්ෂ ද සිල්වා මහත්මා අපිට ශ්‍රී ලංකාවේ ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායම සමග අපේ ඕස්ට්‍රේලියානු තරුණ ක්‍රිකට් කණ්ඩායමකට ක්‍රීඩා කරන අවස්ථාව ලබා දුන්නා.

ඒ සිදුවීම තුලින් මම ලංකාවේ ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රිකට් ක්‍රීඩිකාවන් රැසක් අඳුනගත්තා. මුහුණු පොතේ හමුවූ විට මේ අය නිතරම මගෙන් අහපු දෙයක් තමයි පිරිමි ලමයින්ට වගේ මෙහෙ ඇවිත් ක්‍රිකට් ක්‍රීඩා කරන්න අවස්ථාවක් ලබාගැනීමට හැකිද යන්න. නමුත් ඇත්තවශයෙන්ම විදේශීය පිරිමි ක්‍රිකට් ක්‍රීඩිකයින්ට වගේ කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාවන්ට ඕස්ට්‍රිලියාවේ සාමාන්‍ය ක්‍රීඩා සංගමයක සෙල්ලම් කරන්න තියන අවස්ථාව හොඳටම අඩුයි එනිසා මට උදව්වක් කරන්න ලැබුනේ නැහැ

නමුත් පලමුවරට ඕස්ට්‍රේලියාවේ කාන්තා ක්‍රිකට් T20 තරගාවලිය පටන් ගන්න බව ආරංචි වූ විගසම මීට අවුරුදු 2 කට කලින් 2015 මම Cricket Australia සහ Cricket Victoria දෙකෙන්ම ඉල්ලීමක් කළා අපේ ශ්‍රී ලංකාවේ ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩිකාවන්හට (ක්‍රීඩිකාවන් 3 දෙනෙක්ගේ නම් යවන ලදී) ඒ සඳහා අවස්ථාවක් ලබාදෙන ලෙස. නමුත් පිළිතුර වුනේ විදේශීය ක්‍රිකට් ක්‍රීඩිකාවන් සඳහා, Melbourne Renegades, Melbourne Stars, ක්‍රීඩිකාවන් එංගලන්තයෙන් ,නවසීලන්තයෙන්, බටහිර ඉන්දීය කොදොව් දුපත් වලින් තෝරාගත් බැවින් අපේ අයට අවස්ථාවක් නැති බවයි.

ගිය වසරේද 2016 මම එම ඉල්ලීමම කළ ද "කනගාටුයි ( අවස්ථාවක් නැත" යන්න පිළිතුර විය. නමුත් තුන්වෙනි අවස්ථාවටත් මම අපේ ක්‍රීඩිකාවන් 3 දෙනෙක්ගේ නම් යැවූ විට දවස් දෙකක් ඇතුලත Cricket Victoria වලින් මට කතා කර චමරි අතපත්තු මෙල්බර්න් රෙනේගේඩ්ස් කණ්ඩායමට තෝරාගන්නට කැමති බවත් ඒ සඳහා මගේ උදවු ඉල්ලා සිටියා. මෙහිදී මම ඇයගේ කළමනාකරුද යන්න ඔහුන් ඇසුවිට මා කියා සිටියේ මම එවැනි තනතුරක් දරන්නේ නැති බවත් මගේ එකම අරමුණ මම උපන් රටේ කෙනෙකුට උදවුවක් කිරිම පමණක් ය යන්නය.

එය ඉතා ඉහලින් අගය කල Melbourne Renegades ප්‍රධන පුහුනුකරු Tim සහ කළමණාකාරිය Jess මාත් සමග චමරි අතපත්තු සම්බන්ධිකරණය කරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ පළමු කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාව ඕස්ට්‍රේලියාවේ ක්‍රිකට් කණ්ඩායමකට ක්‍රීඩා කරන අවස්ථාව උදාකරන ලදී

දැන් ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ පළමු කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාව ඕස්ට්‍රේලියාවේ ක්‍රිකට් කණ්ඩායමකට ක්‍රීඩා කරන අවස්ථාව උදාවී ඇත. අපේ ක්‍රීඩිකාවකට ඔස්ට්‍රේලියාවේ කණ්ඩායමකට ක්‍රීඩා කරන්නට අවස්තාව ලබාදීමට හැකි වීම පිළිබඳව මගේ සිතේ ඇත්තේ නිහතමාණී සතුටකි.

රටට ආඩම්බරයක් වෙන ලෙස චමරි විසින් දොරගුළු අරින ලද මේ මාවතේ හෙට දවසේ අපේ ශ්‍රී ලංකාවේ ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ අනිත් ක්‍රීඩිකාවන් ද ආත්ම ශක්තිය පෙරදැරි කරගෙන සිය දක්ෂකම් පෙන්වා ඉදිරියට යනු ඇත.

අපි මේ අවස්ථාවේ චමරි වට එක් රොක් වෙමු. ඇයට ශක්තිය ලබා දෙමු. ඇය ක්‍රීඩා කරන තරග නැරඹීමට එක් රොක් වෙමු.

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

FAIRFIELDS LAWYERS
10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory
Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...